(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 4(8).]

# පාර්ලිමේන්තුවේ අංක 4 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2016 ඔක්තෝබර් මස 28 වැනි සිකුරාදා**

## 2016 නොවැම්බර් මස 10 වැනි බ්‍රහස්පතින්දා
## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— සුරාබදු ආඥාපනතේ (52 වැනි අධිකාරය වන), 32 වගන්තිය සමඟ කියවනු ලබන 22 වගන්තිය යටතේ විදේශීය මත්පැන් මත සුරාබදු පැනවීම සහ විදේශීය මත්පැන් ආනයනය කිරීමට අදාළ රීති පැනවීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යතුමා විසින් පනවන ලදුව, 2016 අගෝස්තු 26 දිනැති අංක 1981/87 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.10.25 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 989 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 1),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යතුමා විසින් පනවනු ලදුව, 2016 අගෝස්තු 19 දිනැති අංක 1980/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.10.26 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 2),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යතුමා විසින් පනවනු ලදුව, 2016 අගෝස්තු 19 දිනැති අංක 1980/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.10.26 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග,— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 60 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, ඒ පනතේ 61 වැනි වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් අග්‍ර විනිශ්චයකාරවරයාගේ එකඟත්වය ඇතිව සාදන ලදුව, 2016 මැයි 16 දිනැති අංක 1967/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.10.26 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වැනි වගන්තිය ප්‍රකාරව සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 අගෝස්තු 23 දිනැති අංක 1981/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.10.25 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## 2016 නොවැම්බර් මස 11 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

704/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2016 අප්‍රේල් මස සිට ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍යයන්හි පළකරන, ණය අර්බුදය පිළිබඳ ප්‍රචාරක දැන්වීම් සඳහා වැය කළ සම්පූර්ණ මුදල කොපමණද;

(ii) එකී ප්‍රචාරක දැන්වීම් පළ කරන ලද පුවත්පත්වල නම් සහ එක් එක් පුවත්පතේ දැන්වීම් පළ කිරීමට වැය වූ මුදල, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එකී දැන්වීම් විකාශනය කිරීම සඳහා රූපවාහිනී සහ ගුවන් විදුලි නාලිකාවන්ට ගෙවූ මුදල්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එකී දැන්වීම් සඳහා අරමුදල් සපයා ගත් ආකාරය කවරේද;

(v) එකී දැන්වීම් සඳහා අරමුදල් සපයා ගත්තේ රජයේ මුදල් භාවිතයෙන් නම්, ඒ සඳහා අරමුදල් සපයා ගත් වැය ශීර්ෂය කවරේද;

(vi) එකී දැන්වීම් සඳහා අරමුදල් සපයා ගත්තේ අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතනවල අනුග්‍රහයෙන් නම්, එම ආයතනවල නම් සහ එක් එක් ආයතනයෙන් ලබා දුන් මුදල්, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

716/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වතුකරයේ පවුල් දෙලක්ෂ පනස් දහසක් සඳහා පර්චස් 7 බැගින් බෙදා දීමට අවශ්‍ය ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එක් එක් වතුයායේ සිටින ඉඩම් අවශ්‍ය පවුල් සංඛ්‍යාව අනුව අවශ්‍ය ඉඩම් ප්‍රමාණය සහ එම වතුවල ඇති මුළු ඉඩම් ප්‍රමාණය එක් එක් වතුයාය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉඩම් අයිතිය පවුලේ අය අතර පමණක් පැවරීමේ නීතියකට යටත්ව ඉඩම් ලබා දෙනු ලැබුවහොත් කම්කරු පවුල් එම ඉඩම් ලබා ගැනීම ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කරුණටම අදාළව 2016.05.06 දින මවිසින් අසන ලද ප්‍රශ්නයට ලබාදුන් පිළිතුර අනුව, නිවාස ඉදිකිරීමට සුදුසු ඉඩම් බොහොමයක තේ වගා කර තිබීම හේතුවෙන්, තේ වගාව තිබෙනතුරු වතුකරයේ ජනතාවට ඉඩම් ලබා දීමට නොහැකි වන බවත්;

(ii) වසර 100කට වැඩි කාලයක් වතුවල පදිංචි වී සිටින මෙම කම්කරු ජනතාවට ඔවුන් පදිංචි නිවසට ඉදිරියෙන් සහ පසුපසින් පර්චස් 7කින් සමන්විත වන පරිදි ඉඩම් ලබාදීමේ හැකියාවක් තිබේද;

(iii) තේ වගාව සඳහා බෑවුම් ප්‍රදේශ යොදාගෙන තැනිතලා ප්‍රදේශ වතු ජනතාවට ලබා දීමේ හැකියාවක් තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

723/'16

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ දේශීය හා විදේශීය ණයබරතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මුළු ණයබරතාවය ජාතික ආදායමේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iii) එම ප්‍රතිශතය 2004 වර්ෂය වනවිට තිබූ ණයබරතාවයේ ප්‍රතිශතයට වඩා අඩුද වැඩිද;

(iv) එම ණය ගෙවීමට රජය යෝජනා කරන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෑතක සිට එම ණයබරතාවය පිළිබඳව ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය මඟින් මෙරට විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා දැන්වීම් ප්‍රචාරය කිරීම සඳහා කොපමණ මුදලක් වෙන්කර තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම දැන්වීම ප්‍රචාරය කිරීම වෙනුවෙන් රාජ්‍ය හා පෞද්ගලික රූපවාහිනී මාධ්‍යයන්ට වෙන් කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රාජ්‍ය හා පෞද්ගලික ගුවන් විදුලි මාධ්‍යයන්ට වෙන් කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) දිනපතා හා සති අන්ත පුවත්පත් සඳහා වෙන් කර ඇති මුළු මුදල කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 නොවැම්බර් මස 12 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

708/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2010 මැයි සිට 2015 ජනවාරි දක්වා කාලසීමාව තුළ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මඟින් වෙළඳ දැන්වීම් ලබාදුන් ජනමාධ්‍ය ආයතන කවරේද;

(ii) එම එක් එක් ජනමාධ්‍ය ආයතනයට වෙළඳ දැන්වීම් ලබාදුන් දිනය, දැන්වීමේ වටිනාකම, එක් එක් ජනමාධ්‍ය ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

728/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 1995 සිට මේ දක්වා ශ්‍රී ලංකා රජය විසින් අය කරනු ලබන සෘජු බදු වර්ග කවරේද;

(ii) එකී එක් එක් බදු වර්ගය අය කිරීමේ පදනම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 1995 සිට 2015 දක්වා සෘජු බදු මඟින් රාජ්‍ය අයභාරයට දක්වන ලද දායකත්වය (රුපියල්), එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත (iii) හි සඳහන් දායකත්වය රජයේ මුළු ආදායමෙහි සහ දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) සංවර්ධිත රටවල් සමඟ සැසඳීමේදී, ශ්‍රී ලංකාවේ සෘජු බදු ආදායම පහළ මට්ටමක පැවැතීමට හේතු කවරේද;

(vi) 2015 වර්ෂයේදී සාක් කලාපයේ රටවල්වලට සාපේක්ෂව, ශ්‍රී ලංකාවේ සෘජු බදු ආදායමෙහි හැසිරීම කෙබඳුද;

(vii) ශ්‍රී ලංකාවේ සෘජු බදු ආදායම ඉහළ නැංවීම සඳහා හඳුන්වාදීමට අපේක්ෂිත විශේෂ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

896/'16

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 සහ 2014 වර්ෂවල දිවිනැගුම සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට වෙන්කරන ලද මුදල, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම මුදල භාවිතා කරමින් කරන ලද ව්‍යාපෘති කවරේද;

(iii) ප්‍රාදේශීය ලේකම් කාර්යාල අනුව වෙන් කළ මුදල වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත වර්ෂවලදී සිදු කරනලද ව්‍යාපෘති සඳහා විධිමත් මිලදී ගැනීම් පටිපාටියක් අනුගමනය නොකිරීම සම්බන්ධයෙන් පැමිණිලි ලැබී තිබේද;

(ii) මෙම වර්ෂවල මේ සම්බන්ධයෙන් විගණනයක් සිදු කර තිබේද;

(iii) එසේ නම්, විගණන වාර්තා ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මුදල් වෙන්කිරීම් නිසා මහජනතාවගේ ජීවන තත්ත්වයේ වෙනස් වීමක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, එම වෙනස්වීම් කවරේද;

(iii) ජීවන තත්ත්වයෙහි වැඩිදියුණු වීමක් සිදු වී ඇති සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2016 නොවැම්බර් මස 15 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

864/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සීමාසහිත ලංකා පොහොර සමාගමේ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයෙකු ලෙස චන්දන පැල්පිට මහතා සේවය කරන්නේද;

(ii) එසේ නම්, ඔහුගේ වැටුප, දීමනා සහ ලබාදී ඇති වාහන සඳහා මාසික කුලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් 2015 නොවැම්බර් 06 දාතමින් පෙත්සම් අංක PCI/52/2015 යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිපියක් එවා තිබේද;

(iv) එම ලිපියේ සඳහන් ආකාරයට චන්දන පැල්පිට මහතා ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස සේවය කළ අවධියේ සිදුකර ඇති බරපතල මූල්‍ය වංචා කවරේද;

(v) එම මූල්‍ය වංචාවන් සඳහා ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ නිර්දේශ කවරේද;

(vi) එම නිර්දේශ ක්‍රියාත්මක කළ දිනය කවරේද;

(vii) ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ නිර්දේශයන් ක්‍රියාත්මක නොකළේ නම්, ඒ සඳහා හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

897/'16

ගරු ඉම්රාන් මහරුෆ් මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තෝප්පූර් උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ආයතනයේ ස්ථිර හා වැඩ බලන කාර්ය මණ්ඩලයේ තොරතුරු කවරේද;

(iii) එම කාර්යාලයෙන් මහජනතාවට ලබාදෙන සේවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිවේදනය කරන ලද LGN සංවර්ධන ව්‍යාපෘතිය තෝප්පූර් උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් සිදු නොකිරීමට හේතුව කවරේද;

(ii) හිටපු දිස්ත්‍රික් ලේකම් විසින් සැලසුම් සහගතව එම ව්‍යාපෘතිය නවතා දමනු ලැබුවේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මහජනතාවගේ යහපත උදෙසා තෝප්පූර් උප කාර්යාලයේ කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව වැඩි කර එමඟින් වැඩිපුර සේවයක් ලබා දීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

914/'16

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින්, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන්ගේ සහභාගිත්වයෙන් මේ දිනවල සමීක්ෂණයක් පවත්වන්නේද;

(ii) අදාළ සමීක්ෂණය සමස්ත දිවයිනෙහිම ක්‍රියාත්මක වන්නේද;

(iii) එසේ නම්, එම සමීක්ෂණයේ අරමුණ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ සඳහා සහභාගී වී ඇති නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමීක්ෂණය සඳහා ගතවන කාලය කොපමණද;

(iii) ඒ සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් මුදල් වෙන් කර තිබේද;

(iv) එසේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 නොවැම්බර් මස 16 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

713/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කම්කරු විනිශ්චය සභාවල ඉල්ලුම්කරු හෝ වගඋත්තරකරු වෙනුවෙන් නියෝජිතයෙකුට පෙනී සිටීමට කාර්මික ආරවුල් පනතේ (සංශෝධිත) 46 වගන්තිය සහ එම පනත යටතේ වන රෙගුලාසි අනුව කටයුතු කිරීම එකී විනිශ්චය සභාවන්හි වර්තමාන සභාපතිවරයන් විසින් ප්‍රතික්ෂේප කරන හේතුව කවරේද;

(ii) සේවකයන්ට පහසුවෙන් හා අඩු වියදමෙන් තම නඩු කටයුතු සිදු කර ගැනීමට වසර 60 ක පමණ කාලයක සිට තිබූ අවකාශය හා පරිචය හදිසියේම නතර කිරීමෙන් රජයේ කම්කරු විරෝධී ආකල්පය තහවුරු කර ඇති බව පිළිගන්නේද;

(iii) ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් කරන ලද ඉල්ලීමක් මත මෙම තත්ත්වය ඇති කර තිබෙන්නේද;

(iv) සාධාරණව හා නීති ප්‍රකාරව පෙර තිබූ තත්ත්වයට කම්කරු උසාවි කටයුතු ප්‍රතිස්ථාපනය නොකළහොත්, නීතිඥයන් ඉදිරිපත් කිරීමට ඉල්ලුම්කරුවන්ට අපහසු වන බව දන්නේද;

(v) නීති ආධාර කොමිෂන් සභාව මඟින් ක්‍රියාත්මක කරන නීතිඥයන් සැපයීමේ නීති ආධාර සේවය ගැන ඉල්ලුම්කරුවන්ට විශ්වාසයක් නොමැති බව දන්නේද;

(vi) නොඑසේ නම්, වෙළෙඳපොළ ආර්ථික ප්‍රතිපත්තියේ මුලින් තිබූ "සමාජ" පදය මේ වන විට ඉවත් වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්. ඒ මන්ද?

898/'16

ගරු චමල් රාජපක්ෂ මහතා,— ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 යල සහ මහ සහ 2016 යල යන කන්න තුන තුළදී ලැබූ මුළු වී අස්වැන්න කොපමණද;

(ii) එයින්, වී අලෙවි මණ්ඩලය මිලදීගත් වී ප්‍රමාණය එක් එක් දිස්ත්‍රික්කය සහ ගබඩාව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මණ්ඩලය විසින් වී කිලෝවක් මිලදී ගත් මිල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2016.07.31 දිනට එම ගබඩාවල ඉතිරි වී ඇති වී තොග ප්‍රමාණය කොපමණද;

(ii) එම ගබඩාවලින් විකුණා ඇති වී තොග ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වී තොග මිලදී ගත් පුද්ගලයන් හෝ සමාගම් සහ ඔවුන්ට වී තොග අලෙවි කළ මිල කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සතොස සහ වෙනත් රජයේ ආයතන සඳහා නිකුත් කර ඇති වී තොග ප්‍රමාණය කොපමණද;

(ii) පුද්ගලයන් සහ සමාගම් සඳහා වී විකුණා ඇති හේතු කවරේද;

(iii) සත්ව ආහාර සඳහා සහ මත්පැන් නිෂ්පාදනයට ලබා දී ඇති වී තොග ප්‍රමාණය සහ අලෙවි කළ මිල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

911/'16

ගරු ප්‍රසන්න රණතුංග මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2007 වසරේ සිට කැළණිය විශ්වවිද්‍යාලය, කථන හා ශ්‍රවණ විද්‍යාවේදී නමින් සිව් අවුරුදු විශේෂ උපාධි පාඨමාලාවක් ආරම්භ කළ බවත්;

(ii) මෙම උපාධි පාඨමාලාව, පළමු වසරින් පසුව කථන හා භාෂා චිකිත්සාව සහ ශ්‍රවනවේදය නමින් විද්‍යාවේදී විශේෂ පාඨමාලාවන් දෙකක් ලෙස නම් කරන බවත්;

(iii) කථන හා භාෂා චිකිත්සාව හැදෑරූ උපාධිධාරින්, භාෂා චිකිත්සකවරුන් ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයට බඳවා ගන්නා බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ශ්‍රවණවේදී උපාධිය සම්පූර්ණ කර ඇති උපාධිධාරින් සෞඛ්‍ය අමාත්‍යාංශය බඳවා ගැනීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

913/'16

ගරු විජිත බේරුගොඩ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වසර පහක කාලය තුළ පහ වසර ශිෂ්‍යත්ව විභාගය,

(i) සඳහා පෙනී සිටි ශිෂ්‍යයන් සංඛ්‍යාව ;

(ii) සමත් ශිෂ්‍යයන් සංඛ්‍යාව;

(iii) සමත් ශිෂ්‍යයන් සංඛ්‍යාව, මුළු ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස;

(iv) සමත් ශිෂ්‍යයන් සංඛ්‍යාවෙන් ශිෂ්‍යාධාර ලැබෙන ශිෂ්‍යයන් සංඛ්‍යාව;

(v) සමත් ශිෂ්‍යයන් සංඛ්‍යාවෙන්, ජනප්‍රිය පාසල්වලට ඇතුළත් වූ ශිෂ්‍යයන් සංඛ්‍යාව;

එක් එක් වර්ෂය සහ එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2016 වසරේ අගෝස්තු මස පැවැත්වූ ශිෂ්‍යත්ව විභාගයේදී සමහර විභාග මධ්‍යස්ථානවල ගැටලු සහ අඩුපාඩු වාර්තා වූ බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එවැනි සිද්ධීන් වාර්තා වූ විභාග මධ්‍යස්ථාන කවරේද;

(iii) ඒ සිද්ධීන් සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන් කවුරුන්ද;

(iv) එම වගකිව යුතු පුද්ගලයන් සඳහා විධිමත් පරීක්ෂණයක් සිදු කරන්නේද;

(v) ගැටලුවලට මුහුණ පෑ ශිෂ්‍යයන්ට යම් අසාධාරණයක් සිදුවී ඇති බව පිළිගන්නේද;

(vi) එසේ නම්, එම ශිෂ්‍යයන්ට සාධාරණයක් ඉටු කිරීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 නොවැම්බර් මස 17 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

899/'16

ගරු චමල් රාජපක්ෂ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වීරවිල සහ යෝධකණ්ඩිය ගොවිජන සේවා මධ්‍යස්ථාන බලප්‍රදේශ මඟින් පොහොර සහනාධාරය සඳහා ඉල්ලුම්කර ඇති ගොවීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ගොවීන් අතරින් පොහොර සහනාධාර මුදල් ලබාදුන් ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(iii) පොහොර සහනාධාර මුදල් ලබාදීමට නියමිත ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(iv) පොහොර සහනාධාර මුදල් නොලැබුනු ගොවීන් සඳහා මුදල් ලබාදීමට නියමිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

900/'16

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ, එල්ෆින්ස්ටන් රඟහල ඉදිරිපිට ඇති ට්‍රිපොලි වෙළඳ සංකීර්ණයේ ගබඩා නවීන ලෙස අළුත්වැඩියා කර දීර්ඝ කාලයක් තිස්සේ වසා තිබෙන්නේද;

(ii) එම ගොඩනැගිලි පාවිච්චියට නොගෙන වසා තිබෙන්නේ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

915/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 හි විධිවිධාන අනුව ගුරුවරුන් සඳහා උසස්වීම් ලබා දී ඇති බවත්;

(ii) කළුතර, හොරණ සහ මතුගම අධ්‍යාපන කලාපවල පාසල් බොහොමයක ගුරුවරුන් සඳහා එම උසස්වීම් අනුව, 2011.01.01 දින සිට ලැබිය යුතු හිඟ වැටුප් මෙතෙක් ගෙවා නොමැති බව එතුමා පිළිගන්නේද;

(iii) එසේ නම්, එම ගුරුවරුන් සඳහා හිඟ වැටුප් නොගෙවීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

906/'16

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ III වැනි ශ්‍රේණියට නිලධාරින් බඳවා ගැනීම සඳහා 2016.07.22 වැනි දින ගැසට් පත්‍රය මඟින් අයදුම්පත් කැඳවා තිබේද;

(ii) එම නිලධාරින් බඳවා ගැනීම සඳහා ඉල්ලා ඇති සුදුසුකම් හා ඉල්ලුම්පත් කැඳවන අවසන් දිනයට වයස් සීමාව කවරේද;

(iii) උපාධිධාරී අයදුම්කරුවන්ට අවුරුදු 22 - 28 අතර වයස් සීමාවක් පැනවීම සාධාරණ නොවන බැවින්, රැකියා විරහිත උපාධිධාරීන්ට ද ඉල්ලුම් කිරීමට හැකිවන ලෙස එහි උපරිම වයස් සීමාව අවුරුදු 30 දක්වා ඉහළ දැමීමට කටයුතු කරන්නේද?

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

916/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වසර සඳහා කළුතර, බේරුවල හා පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අයත් පාසල්වල කතෝලික/ ක්‍රිස්තියානි ධර්මය විෂය සඳහා පැවති පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද?

(ii) 2015 ජාතික විද්‍යාපීඨ සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබුවේ එම පුරප්පාඩු අනුවද;

(iii) එම සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඒ අනුව, සම්මුඛ පරීක්ෂණයෙන් තෝරාගත් අයදුම්කරුවන්ගේ නම් කවරේද;

(v) බේරුවල, මග්ගොන, මුංහේන පදිංචි බී. ඩී. එස්. සයනි විදර්ශනා මෙනෙවිය 2015.11.14 දින බිංගිරිය ජාතික විද්‍යා පීඨයේ පැවති සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබුවේද;

(vi) එසේ නම්, ඇය තෝරා නොගැනීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 නොවැම්බර් මස 18 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

904/'16

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ක්‍රියාන්විත සේවයේ යෙදෙන යුද හමුදා සෙබළුන්ගේ යැපෙන්නන් සඳහා කොළඹ හමුදා රෝහලේ නේවාසික ප්‍රතිකාර පහසුකම් ලබාදෙන නමුත්, පොලිස් නිලධාරින්ගේ යැපෙන්නන්ට එම පහසුකම කොළඹ පොලිස් රෝහලේදී නොලැබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) එකම ක්‍රියාන්විත රාජකාරියකදී මියගිය සෙබළුන්ගේ යැපෙන්නන්ට හා පොලිස් නිලධාරින්ගේ යැපෙන්නන්ට දෙයාකාරයකට සැලකීම මඟින් පොලිස් නිලධාරින්ගේ යැපෙන්නන්ට බලවත් අසාධාරණයක් සිදුවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) විවෘත කිරීමට නියමිත නාරාහේන්පිට නව පොලිස් රෝහල වෙතින් පොලිස් නිලධාරින්ගේ යැපෙන්නන් සඳහාද එම නේවාසික ප්‍රතිකාර පහසුකම ලබා දීමට කටයුතු සලසා දෙන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

923/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුප්‍රීම් සැට් පෞද්ගලික සමාගම සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අතර චන්ද්‍රිකා තාක්ෂණය සම්බන්ධ ගිවිසුමක් අත්සන් කර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම පෞද්ගලික සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iv) එම සමාගමේ ආයෝජනය කොපමණද;

(v) චන්ද්‍රිකා තාක්ෂණය සම්බන්ධයෙන් ඔවුන්ගේ වෘත්තීය පළපුරුද්ද කවරේද;

(vi) එම ගිවිසුම සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1004/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යුද්ධයෙන් පසුව සරණාගත කඳවුරුවල ජීවත්වන දෙමළ ජනතාවට අයත් රත්‍රන් විශාල ප්‍රමාණයක් කවුරුන් හෝ භාරයේ තබා තිබේද;

(ii) මෙම රත්‍රන් තැන්පතු ගණනය කර තිබේද;

(iii) එම පුද්ගලයන්ගේ රත්‍රන් මෙතෙක් ඔවුන් වෙත යළි ලබා දී නොමැති බවට පැමිණිලි කර තිබේද;

(iv) ඉහත (i) සම්බන්ධයෙන් පවතින තොරතුරු කවරේද;

(v) එම හිමිකම්පෑම නිරාකරණය කිරීම සඳහා රජය මඟින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2016 නොවැම්බර් මස 19 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

912/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර, කොලොන්න, බොරලුවාගේ අයින ග්‍රාම නිලධාරි වසමේ, හේයිස් වත්තෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම විසින් රාජ්‍ය වැවිලි සංස්ථාවට පැවරූ ඉඩම්වලින් හෙක්ටයාර 405ක ප්‍රමාණයක් ප්‍රත්‍යාදිෂ්ඨකර ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම් සභාව වෙත නැවත පවරාගෙන ඇති බව පිළිගන්නේද;

(ii) ගොන්ගල කන්දේ පිහිටි සන්නිවේදන කුළුණු 11න් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම් සභාවට ලැබෙන බදු ආදායම 1996 වර්ෂයේ සිට සී/ස මතුරට වැවිලි සමාගම විසින් ලබාගන්නා බව දන්නේද;

(iii) 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත ප්‍රකාර අතුරු බදුදීම සපුරා තහනම්ව තිබියදී, සී/ස මතුරට වැවිලි සමාගම විසින් අතුරු බදු ගිවිසුම් මඟින් කුළුණු 11ක් ඉදිකිරීමට සන්නිවේදන සමාගම් වෙත අනුමතිය ලබාදී ඇත්තේ කෙසේද;

(iv) මෙම වංචනික ක්‍රියාව පිළිබඳව අදාළ වතු සමාගමට විරුද්ධව නීත්‍යානුකූලව පියවර ගෙන එකී ආදායම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම් සභාව වෙත ලබා ගැනීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

917/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 ජනවාරි සිට 2015 ජනවාරි දක්වා කාල සීමාව තුළ, ඝාතනය වූ, අතුරුදහන් වූ, පහරදීමට ලක්වූ සහ අත්අඩංගුවට ගත් මාධ්‍යවේදීන්ගේ නම් හා ඔවුන් එම සිදුවීම්වලට ලක්වූ දින වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම කාලසීමාව තුළ ප්‍රහාරයට ලක්වූ ජනමාධ්‍ය ආයතන හා එම ප්‍රහාර සිදු වූ දින කවරේද;

(iii) ඉහත සිදුවීම්වලට අදාළව පැවැත්වෙන පරීක්ෂණවල ප්‍රගතිය එක් එක් පරීක්ෂණය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 නොවැම්බර් මස 22 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

535/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 වනවිට ශ්‍රී ලංකාවේ සෝයා බෝංචි වගා කරන භූමි ප්‍රමාණය කොපමණද;

(ii) 2010 සිට 2015 දක්වා කාලය තුළ සෝයා බෝංචි නිෂ්පාදනය, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කිලෝග්‍රෑම් කොපමණද;

(iii) රජය විසින් ගොවීන්ගෙන් සෘජුවම සෝයා බෝංචි මිලදී ගන්නේද;

(iv) එසේ නම්, පසුගිය වසර පහ තුළ රජය විසින් මිලදී ගත් සෝයා බෝංචි ප්‍රමාණය, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සෝයා බෝංචි නිෂ්පාදනය ඉහළ නැංවීමට රජය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

771/'16

ගරු බිමල් රත්නායක මහතා,— කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) 2013, 2014 සහ 2015 වර්ෂවල ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ,

(i) ලියාපදිංචිව තිබූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව;

(ii) අලුතින් ලියාපදිංචි වූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2013, 2014 සහ 2015 වර්ෂවල අලුතින් ලියාපදිංචි වූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව,

(i) රජයට අයත් සමාගම්;

(ii) අර්ධ රාජ්‍ය ආයතන;

(iii) පෞද්ගලික අංශය;

(iv) කර්මාන්ත අංශය;

(v) කෘෂිකර්මාන්ත අංශය;

(vi) සේවා අංශය;

අනුව සහ එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?